**ශීර්ෂය 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

---------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පින්ඩන වාර්තාව 2022 මැයි 25 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී අත්තිකාරම් මුදල් අයකිරීම් CIGAS ශේෂ පිරික්සුම අනුව රු.9,492,823ක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ගිණුම් ප්‍රකාශ - SASO අනුව රු.8,956,153ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අත්තිකාරම් අයකිරීම් රු. 536,670ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර තිබුණි. | CIGAS ශේෂ පිරික්සුම අනුව නිවැරදිව ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | දෙපාර්තමේන්තු පොත් අනුව ගිණුම් තැබිය යුතුය. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි. | කොරෝනා වසංගත තත්වය මත ප්‍රමාද වී ඇති බැවින් ඉක්මනින් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගත යුතුය. |
| (ආ) | **බැරකම් ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් සටහන් කළ යුතුය. | මෙය පරිසනක මෘදුකාංගයේ යාවත්කාලීන වී දිනපතා පවතින අතර අවශ්‍ය නම් මුද්‍රණය කරගත හැක. | බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි පරිදි බැරකම් ලේඛනයක සටහන් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සියලු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය රු. 395,100,000 ක් වූ අතර මුළු වියදම රු. 342,198,581ක් විය. එබැවින් ඉතිරිය රු.52,901,419ක් නොහොත් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 13.4ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | බලාපොරොත්තු වූ පරිදි වියදම් උද්ගත නොවීම, දායක මුදල් ගෙවීමට අදාල ඉන්වොයිස්පත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකිරීම හා රාජ්‍ය වියදම් සමාලෝචනය සඳහා වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුගතව කටයුතු කිරීම නිසා මෙම ඉතිරිවීම් සිදු වී ඇත. | ඇස්තමේන්තු සැකසීම හා වියදම් කළමණාකරනය යාවත්කාලීන විය යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් සියයට 36 කද, ප්‍රාග්ධන වැය විෂයයන් 06කද සියයට 90 සිට සියයට 100 පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | භාණ්ඩාගාර ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කල යුතුය. |
| (ඇ) | වැය විෂයයන් 06 කට වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන සියයට 20 සිට සියයට 300 දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එම අවශ්‍ය අතිරේක ප්‍රතිපාදනයන් වෙනත් වැය විෂයන් ගෙන් මාරු කර ලබා ගන්නා ලදි. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිසි පරිදි ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ ගෙවීම් වවුචර්පත් අනුව වැය විෂයයන් 05ක් සඳහා වූ බැරකම් රු.155,702ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම රු155,702ක් වටිනා බැරකම් එම දිනට පසුව ගෙවීම් සඳහා ඉදිරිපත් වූ වවුචර්පත්වලට අදාල බැරකම් වේ. එම නිසා මෙම බැරකම් මූල්‍ය ප්‍රකාශනය තුලට ඇතුලත් කිරීමට නොහැකි විය. | වර්ෂයට අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සම්මාදම් සහ දායක මුදල් යටතේ කලාපීය ඒකාබද්ධ බහුඋපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (RIMES), නිවර්තන සුළිසුළං පැනලය හා ෆයර්වෝල් දායකත්වය සඳහා ගෙවියයුතු දායක මුදල් සඳහා 2021 දෙසැම්බර් 31 දිනට ඉන්වොයිස්පත් නොලැබීම නිසා රු. 1,998,960ක බැදීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සාමාන්‍යයෙන් මෙතෙක් දායක මුදල් සඳහා පසුගිය අවුරුදුවලට අදාළ හිඟ මුදල් අයදුම් කිරීම් අදාළ ආයතනය මගින් සිදු කර නොමැති නිසා ඉහත වටිනාකම බැදීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් නොකරන ලදි. | වර්ෂයට අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීතිරීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ----------------- | ----------- | ---------------------------- | -------------- |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 396(ඇ) | එකතු වටිනාකම රු.87,398ක චෙක්පත් 08ක් නිකුත්කර මාස 06ක් ඉක්මවා ගෙවීමට ඉදිරිපත් කර නොතිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොතිබුණි. | මේ වන විටද ගෙවීමට ඉදිරිපත් කර නොමැති ඉතිරි චෙක්පත් සඳහා මු.රෙ ප්‍රකාරව ක්‍රියාකිරීමට බලාපොරොත්තු වේ. | මාස 06ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි565 (5) | මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊලඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | මාසික තැන්පතු ප්‍රකාශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 570 | ඉකුත් තැන්පත් පිළිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | ඉකුත් තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 571 | අවුරුදු 02 ක් ඉක්මවූ රු.206,177ක තැන්පතු අවස්ථානෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි තැන්පතු මෙම වර්ෂයේ දී රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කර ඇත. | අවුරුදු 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ)** | 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතු වාහන 08ක ඉන්ධන පරීක්ෂාවන් කර නොතිබුණි. | මෙම වර්ෂයේ වාහන ඉන්ධන පරීක්ෂණ සිදු කිරීමට ඇති බව දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කළ යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කිරීමේදී ඇස්තමේන්තු ඉදිරිපත්කර ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් පමණක් නිකුත් කළ යුතු වුවත්, අවශ්‍යතාවය ඉක්මවා අවස්ථා 12කදී අත්තිකාරම් නිකුත් කර තිබූ අතර ලබා දී තිබුණු අග්‍රිමයෙන් සියයට 36 සිට සියයට 84 දක්වා වූ පරාසයකින් ඉතිරිවීම් සිදු වී තිබුණි. | අවශ්‍ය අවස්ථාවලදී අදාළ වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නිසි අනුමැතිය යටතේ ඉල්ලුම් කරන ලද අත්තිකාරම් මුදල් ගිණුම් අංශය මගින් ලබා දී ඇත. බලාපොරොත්තු වූ පරිදි වියදම් වී නොමැති බැවින් ඉතිරි වී ඇත. | අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි අත්තිකාරම් ලබා ගැනීමට හා ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම | | |

| | | | |
|---|---|---|---|
| **(i)** | මියගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 274,448 ක ණය ශේෂය 2022 අප්‍රේල් වනවිටත් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමේ ලිපි විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අප වෙත ලැබී නොමැති බැවින් එම ශේෂය නිරවුල් කර නොහැක. | නිලධාරින්ගේ ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු එකතු වටිනාකම රු. 124,830ක ණය ශේෂ අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ගෙවීම් පැහැර හැරියොත් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | සේවය හැර ගිය නිලධාරින්ගේ ණය ශේෂ නොපමාව අය කල යුතුය. |
| **(iii)** | විශ්‍රාමගොස් ඇති නිලධාරීන් තුන්දෙනෙකුගෙන් රු.249,032ක ආපදා ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි. | නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ඉදිරි කටයුතු සිදුකිරීම මත ඉදිරි තීරණ ගනු ලැබේ. | විශ්‍රාම ගොස් ඇති නිලධාරින්ගේ ණය ශේෂ නොපමාව අයකර යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලසුමට ඇතුළත්කර තිබූ හැකියා වර්ධනය, කාලගුණ විද්‍යා උපකරණ මිලට ගැනීම, ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම සහ ඩොප්ලර් රේඩාර් පද්ධතියේ කටයුතු යන කාර්යයන්වල ප්‍රගතිය සියයට 10 කට වඩා අඩු අගයක් ගෙන තිබුණි. | රටේ පැවති කොරෝනා වසංගත තත්වය හා ඇදිරි නීති තත්වය මත දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්ම අනුව සඳහන් කර ඇති කාර්යයන් 05 හි ප්‍රගතිය සියයට 10 ට වඩා අඩු විය. | ප්‍රතිපාදන උපයෝජනය කරගෙන ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතුය. |

**3.2 වියදම් කළමණාකරනය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඩොප්ලර් රේඩාර් පද්ධතියේ කටයුතු වෙනුවෙන් වෙන්කළ රු. මිලියන 12ක ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් දරා නොතිබුණි. 2021 වර්ෂයේ කාලගුණ විද්‍යා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 11ක් ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද වැය කර තිබුණේ රු. මිලියන 0.95ක් වූ අතර කාලගුණ විද්‍යා උපකරණ ප්‍රසම්පාදනය අවලංගු කර තිබුණි. ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් යටතේ රු. මිලියන 0.5ක වියදම් දරා තිබුණු අතර ප්‍රතිපාදනයෙන් සියයට 91 ක් ඉතිරිවී තිබුණි. ගොඩනැගිලි | ටෙන්ඩර් පටිපාටිය අනුව තෝරා ගත් සමාගම් සමග මිල ගණන් පිළිබඳව සාකච්ඡා කිරීමේ දී අදාළ කටයුතු සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණවත් නොවන බව අනාවරණය වීම නිසා මෙම ව්‍යාපෘතිය නියමිත පරිදි ක්‍රියාත්මක නො වීම. | ප්‍රතිපාදන උපයෝජනය කරගෙන ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

ඉදිකිරීම් වෙනුවෙන් රු. මිලියන 10ක ප්‍රතිපාදන සලසා දී තිබුණද රු. මිලියන 0.39 ක් වියදම් දරා තිබූ අතර ප්‍රතිපාදනයෙන් සියයට 96ක් ඉතිරි වී තිබුණි.

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ගොන්ගල රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 402.8ක් වැය කර වර්ෂ 12ක් ගතවී තිබුණද එම කාර්යය මේ දක්වා ඉටුකර නොතිබුණි. තවද, අදාළ කාර්යය සඳහා රැගෙන එන ලද උපකරණ වලින් රු.මිලියන 9.1 ක් වටිනා උපකරණ අස්ථානගත වී තිබූ අතර ඉදිරිපත්කර තිබූ හානි හා පාඩු ලේඛනයේ එම වටිනාකම රු.මිලියන 4.9ක් ලෙස දක්වා තිබුණි. එමෙන්ම මෙම අස්ථානගතවීමට වගකිව යුතු නිලධාරීන්ද හඳුනාගෙන නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත දැනට පවතින භාණ්ඩ හා කුළුණ සහිත ගොඩනැගිල්ල එහි නතරව සිටින යුදහමුදා බලධාරීන් වෙත තාවකාලික ප්‍රයෝජනය සඳහා පවරා දී ඇත. | මෙම අස්ථානගත වීමට හා අසාර්ථක ව්‍යාපෘතියට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සහ රජයට සිදු වූ අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවලදී සිට වාර්ෂික තොග සමීක්ෂණයේදී හඳුනාගත් යල්පැන ගිය හා විනාශ කලයුතු අබලි භාණ්ඩ අයිතම 135 ක් ඉවත් කිරීමට හෝ සුන්බුන් අගයට අලෙවිකර ආදායමක් උපයා ගැනීමට හෝ ක්‍රියා කර නොතිබුණි. | ඉදිරියේ දී මේ සම්බන්ධව කටයුතු කිරීමට නියමිතය. | කළමනාකරණය විසින් ඒවා ඉවත් කිරීමට හෝ සුන්බුන් අගයට අලෙවිකර ආදායමක් උපයා ගැනීමට හෝ ක්‍රියා කළ යුතුය. |

**3.5** **බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තැන්පත්කරු හඳුනාගත නොහැකිව ලැබී තිබූ වටිනාකම රු.616,934 ක්වූ චෙක්පත් 107ක් හඳුනාගෙන අදාළ ආදායම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොරෝනා කාලය තුල දත්ත ඉල්ලුම් කරනු ලබන පුද්ගලයින්හට සෘජුව ගිණුමට මුදල් තැන්පත් කරන ලෙස දන්වා ඇති අතර මුදල් තැන්පත් කිරීමෙන් පසු අදාළ තොරතුරු අදාළ අංශයට ලබාදී තමාට අවශ්‍ය දත්ත ලබාගත හැකි බව දන්වා ඇත. | ලැබීම් තහවුරු නොවූ චෙක්පත් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ජපන් යෙන් මිලියන 2,503ක ප්‍රදානයක් ලබාදීම සඳහා 2017 ජූනි 30 ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රජය මඟින් රු. මිලියන 486.6ක මුදලක්ද දැරිය යුතු වන අතර 2017 වර්ෂයේ සිට මේ දක්වා වසර 05ක කාලයක් ගත වී තිබුණද, මෙතෙක් ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. | යම් ප්‍රමාදයක් පැවතිය ද 2019 වසරේ සිට ඉදිකිරීම් සඳහා අනුමැතිය ගැනීම ආරම්භ කර ඇත. ඉන් පසු කොරෝනා වසංගත තත්වය නිසා 2020 වර්ෂයේ දී කටයුතු ඇණ හිට තිබුණි. නැවත 2021 වර්ෂයේ වැඩ කටයුතු ආරම්භ කළ ද 2017 දී ඇස්තමේන්තු කළ මුදල ප්‍රමාණවත් නොවීම නිසා ටෙන්ඩර් පටිපාටිය අතරමග නතර කිරීමට සිදු විය. | ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පොතුවිල් රේඩාර් කුළුණු ඉදිකරනු ලබන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමියද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මෙතෙක් පවරා ගෙන නොතිබුණි. | පොතුවිල් කාර්යාල භූමිය පවරා ගැනීමට අදාල කටයුතු දැනට වසර කිහිපයකට පෙර ආරම්භ කර ඇත. නමුත් අප දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර හේතු මත තවදුරටත් ප්‍රමාද වෙමින් ඇත. | භූමිය කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර තිරසාර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳ දෙපාර්තමේන්තුව දැනුවත්ව සිටියද, ඒ අනුව සැලැස්ම සකසා අවසන් කිරීමත්, තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීමේ ප්‍රගතිය,අධීක්ෂණය, පසු විපරම සහ සමාලෝචනය කිරීමෙන් වාර්තා කිරීමත් සිදු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල ව්‍යාපෘති හා වැඩසටහන් මඟින් සපුරා ගන්නා තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ඇති අතර ඒ ඒ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් නිර්ණය කර තිබේ. | තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟාවීමේ ප්‍රගතිය,අධීක්ෂණය, පසු විපරම සහ සමාලෝචනය වාර්තා කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 460ක් වූ අතර සත්‍ය සේවක සංඛ්‍යාව 355ක් වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 105කි. වර්ෂ ගණනාවක සිට පුරප්පාඩු වී තිබූ තනතුරු 105ක්ම අත්‍යවශ්‍ය තනතුරු වන බැවින් ආයතනයේ අරමුණු හා කාර්යයන් නිසි ලෙස ඉටුකර ගැනීමට සැලකිය යුතු බලපෑමක් සිදුවී තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. | දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අභ්‍යන්තර විගණක තනතුර 2013 වර්ෂයේ සිට 2019 ජූලි 01 දින දක්වා පුරප්පාඩුව පැවති අතර තනතුරට පත්කරනු ලැබූ නිලධාරිණිය 2020 අප්‍රේල් 17 දින ස්ථාන මාරු වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දක්වා පුරප්පාඩුව පිරවීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තු රාජකාරි අවශ්‍යතාව සඳහන් කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දිගින් දිගටම සිදු කළ ඉල්ලීම් අනුව 2022.03.22 දින සිට එකී තනතුරේ රාජකාරි වැඩ බැලීම සඳහා නිලධාරිණියක් අනුයුක්ත කිරීම සිදුකර ඇත. | අභ්‍යන්තර විගණක තනතුරු පුරප්පාඩුව පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව සඳහා 2021 වර්ෂයට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේ කටයුතු ආරම්භ කර ඇත. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම නොපමාව සකස් කළ යුතුය. |
| (ඈ) | ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා 1988 අංක 74 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 91 දෙනෙකුගෙන් 53 දෙනෙකු විසින් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා 1988 අංක 74 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 38 දෙනෙකු පමණක් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබිණ. | (සංශෝධන) පනත් ප්‍රකාරව ඊට අදාල සියලු නිලධාරීන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂයේ නිලධාරීන් ලබාගත් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකිරීම් 2022 අප්‍රේල් 30 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හා වරින්වර චක්‍රිය පදනම මත රාජකාරියට කැඳවීම ආදී කරුණු නිසා මේ වන විටත් 2021 වර්ෂයේ නිලධාරීන් ලබාගත් නිවාඩු යාවත්කාලීන කරමින් පවතී. | වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකිරීම් නොපමාව යාවත්කාලීන කල යුතුය. |